# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## පුරවැසි අධ්‍යාපනය

විභාග අංකය:.................................... 2024-08

| 9 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02යි |
|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### I කොටස

අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(1) සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු වැදගත් කාර්යයක් වන්නේ ,

1) ප්‍රජා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම 2) ආහාර හා පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම
3) යහපත් සමාජානුයෝජනයක් සඳහා මගපෙන්වීම 4) සමාජ යුතුකම් හා වගකීම් ඉටුකිරීම

(2) යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන හිතකර ප්‍රතිලාභයක් වන්නේ ,

1) සම්පත් භාවිතය අකාර්යක්ෂම වීම 2) මිනිසා යාන්ත්‍රික වීම
3) පාරිසරික තුල්‍යතාවය රැකගත නොහැකි වීම 4) සම්පත් වල ඵලදායීතාවය ඉහළ යාම

(3) ශ්‍රී ලංකාවට ආවේණික සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න ,

1) නිල කොබෙයියා,කළු වඳුරා, අං කටුස්සා, වලි කුකුළා 2) කළු වඳුරා,වලි කුකුළා,කොහා, පතිරන සාලයා
3) පතිරන සාලයා, වලි කුකුළා, අංකටුස්සා,මාල ගිරවා 4) නිල කොබෙයියා,මොණරා,අංකටුස්සා,මාල ගිරවා

(4) රටක නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා ලබාදීමේ ක්‍රියාවලිය

1) නිෂ්පාදනය 2) බෙදාහැරීම 3) පරිභෝජනය 4) තාක්ෂණය

(5) ශ්‍රී ලංකාවේ නාවික හමුදාව ආරම්භ කරන ලද දිනය වනුයේ ,

1) 1950 දෙසැම්බර් 9 වෙනිදා ය 2) 1949 ඔක්තෝම්බර 10 වෙනිදා ය
3) 1950 ඔක්තෝම්බර් 10 වෙනිදා ය 4) 1949 දෙසැම්බර් 9 වෙනිදා ය

(6) ශ්‍රී ලංකා පුරවැසියෙකුට ඡන්ද බලය හිමිකර ගැනීම සඳහා සම්පූර්ණ වී තිබිය යුතු වයස වන්නේ ,

1) අවුරුදු 17 දී ය 2) අවුරුදු 18 දී ය 3) අවුරුදු 21 දී ය 4) අවුරුදු 22 දී ය

(7) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කළ විද්වතෙකි ,

1) ඇරිස්ටෝටල් 2) මහාචාර්ය ගානර් 3) සීලර් 4) ඒ.බී. ටයිලර්

(8) රටක උත්තරීතරම නීතිය ලෙස සැලකෙන්නේ ,

1) අපරාධ නීතිය යි 2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි 3) සිවිල් නීතිය යි 4) දේශීය නීතිය යි

(9) වර්තමාන කටයුතු සඳහා සම්පත් යොදාගෙන පරිසරයට හානියක් නොවන අයුරින් සිදුකරන සංවර්ධනය ,

1) පරිසර සංවර්ධනය යි. 2) ආර්ථික සංවර්ධනය යි.
3) සමාජ සංවර්ධනය යි. 4) තිරසාර සංවර්ධනය යි.

(10) ඇමරිකා එක්සත් ජනපදයේ වහල් භාවය ඉවත් කිරීමට කටයුතු කළ ජනාධිපතිවරයකු වන්නේ ,

1) ඒබ්‍රහම් ලින්කන් 2) සීලර් 3) ජෝජ් බුෂ් 4) තෝමස් අල්වා එඩිසන්

(ල. 2 x 10 = 20)

අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න

(11) ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රටක් ලෙස .................................... (එක්සත් රාජධානිය /චීනය/ලංකාව) නම් කළ හැක .

(12) " අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී " මෙම ප්‍රකාශය .................................... විසින් කියන ලද්දකි. ( කුමාරතුංග මුනිදාස මහතා/ ආනන්ද සමරකෝන් මහතා/ මර්ෂලින් ජයකොඩි මහතා )

(13) මහජනතාවගේ බහුතර කැමැත්ත මත ඔවුන් විසින් ගොඩනගා ගනු ලබන පාලන ක්‍රමය .................................... පාලනය ලෙස හැඳින්වේ. ( සමූහාණ්ඩු/ රාජාණ්ඩු / ප්‍රජාතන්ත්‍රවාදී )

(14) සමුපාකාර ව්‍යාපාරයේ පියා .................................... ලෙස හැඳින්වේ.
( රොබට් ඕවන්/ එඩ්මන් බර්ක්/මොරිස් ඩුවයිජන්)

(15) "මල්ලියේ නරක මිතුරන් පිළිගන්න එපා " මෙම ගීතය .................................... මහතා විසින් ගායනා කරන ලද්දකි ( විශාරද එඩ්වඩ් ජයකොඩි / විශාරද සුනිල් එදිරිසිංහ/ විශාරද සනත් නන්දසිරි)

(ල. 2 x 5 = 10)

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති වගන්ති නිවැරදි නම් (  ) ලකුණ ද , වැරදි නම් (  ) ලකුණ ද යොදන්න

(16) ඇතැන්ස් පොර රජයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ පුරවැසි සභාවයි . (  )

(17) " සැම එකාටත් එකා සැමටත් " සමුපාකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වේ. (  )

(18) තමන් ඇගලා ගත් ඇඳුම තමන් විසින්ම සකසා ගත් රාජ්‍ය නායකයකු ලෙස මහත්මා ගාන්ධිතුමා හැඳින්විය හැක. (  )

(19) අධිකරණ ක්‍රියාවලියට අවනත වීම අධිකරණ සම්බන්ධ පුද්ගල වගකීමක් හා යුතුකමක් වේ. (  )

(20) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය වන්නේ අභියාචනාධිකරණයයි . (  )

(ල. 2 x 5 = 10)

## II කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න .
පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

(1) 1) සමාජ සුරක්ෂිතභාව කෙරෙහි දායක වන ආයතන දෙකක් ලියන්න .

(2) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදෙන කොටස් දෙක ලියන්න .

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදර්ශ පාඨය ලියන්න .

(4) වර්තමානයේ නවීන තාක්ෂණය යොදා ගන්නා අවස්ථා දෙකක් ලියන්න .

(5) අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය යොදා ගැනෙන අවස්ථා දෙකක් ලියන්න .

(6) ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක ලියා දක්වන්න .

(7) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් දෙකක් ලියන්න .

(8) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතු දෙකක් ලියන්න .

(9) දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් ලියන්න .

(10) ආර්ථිකයේ සිදුවන වෙනස් වීම් ප්‍රධාන අංශ තුනක් යටතේ සලකා බැලිය හැක. ඉන් දෙකක් ලියන්න .

(ල. 2 x 10 = 20)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(2) 1) සමාජ සුරක්ෂිතතාව යන්න කෙටියෙන් හඳුන්වන්න .

2) සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ආගමික ආයතන මගින් ඉටු කරනු ලබන මෙහෙවර තුනක් ලියන්න .

3) සමාජ සුරක්ෂිතතාව ලබාදෙන සමාජ ආයතන පහක් ලියන්න .

(ල. 2 + 3 + 5 = 10)

(3) 1) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියට අයත් අධිකරණ ආයතන දෙකක් ලියන්න .

2) නීතියේ ගුණාංග තුනක් ලියා දක්වන්න .

(3) නීතියේ මූලාශ්‍ර පහක් ලියන්න .

(ල. 2 + 3 + 5 = 10)

(4) 1) ආර්ථිකයේ සිදුවන ප්‍රධාන ක්‍රියාවලින් තුනක් ඇත. ඉන් දෙකක් නම් කරන්න .

2) තාක්ෂණය වෙනස් වීමත් සමඟ ඇතිවන සමාජ වෙනස් වීම් තුනක් ලියන්න .

3) තාක්ෂණය වෙනස් වීම නිසා ඇතිවන හිතකර බලපෑම් තුනක් සහ අහිතකර බලපෑම් දෙකක් ලියන්න .

(ල. 2 + 3 + 5 = 10)

(5) 1) නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ තේ නිෂ්පාදනය විවිධාංගීකරණය වී ඇති ආකාර දෙකක් ලියන්න .

2) තාක්ෂණය වෙනස් වීමත් සමඟ කාර්මික අංශයේ සිදුවී ඇති වෙනස් කම් තුනක් ලියන්න .

3) තාක්ෂණය වෙනස් වීමත් සමඟ නව ප්‍රවණතා ඔස්සේ විවෘත වන රැකියා පහක් ලියන්න .

(ල. 2 + 3 + 5 = 10)

(6) 1) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් ලියන්න .

2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ තුනක් ලියන්න .

3) ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත්වන පුරවැසියෙකු සතු අයිතිවාසිකම් පහක් ලියන්න .

(ල. 2 + 3 + 5 = 10)

(7) 1) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවත්වනු ලබන මැතිවරණ දෙකක් ලියන්න .

2) දේශපාලන පක්ෂයක කාර්යභාරයන් තුනක් ලියන්න .

3) ස්ථිරසාරභාවය ගොඩනගා ගැනීම සඳහා පුද්ගලයෙකු තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග පහක් ලියන්න.

(ල. 2 + 3 + 5 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.